**#mediaethicsSL #SinhalaPress #lka #Divaina #June09**

සාවද්‍ය ප්‍රවෘත්ති පළ කිරීම යනු පුවත්පතකින් සිදුකළ හැකි බරපතළම මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයන්ගෙන් එකකි. එසේම යම් ප්‍රවෘත්තියක් සඳහා පාදක කොටගත් මූලාශ්‍රයන් සඳහන් කිරීමද යහපත් මාධ්‍ය ආචාර ධාර්මික භාවිතයකි.

මෙම ආචාර ධර්මයන් ද්විත්වය බොහෝ ක්ෂේත්‍රයන් හා සම්බන්ධ පුවත් සඳහා අදාළ වන අතර, විද්‍යාත්මක කරුණු කාරණා අන්තර්ගත ප්‍රවෘත්ති සහ ලිපි සඳහා තරයේ පිළිපැදීම අවශ්‍ය වේ. එයට හේතුව වන්නේ බොහෝ විට යම් යම් විද්‍යාත්මක කරුණු සම්බන්ධයෙන් සාමාන්‍ය පාඨකයාට සුවිශේෂී දැනුමක් නොමැති වීමත්, එනිසා සාවද්‍ය විද්‍යාත්මක කරුණු පළ කිරීම ඔස්සේ එම සාවද්‍ය මතයන් ජනගත වීමත් නිසාවෙනි.

ඒ කෙසේ වෙතත් ගැටළුව වන්නේ දිවයින පුවත්පත මගින් විශේෂ විද්‍යාත්මක ඥාණයක් නොමැති පාඨකයෙකු වුවද නොරුවටෙන ආකාරයේ පුවතක්, නව විදු සොයාගැනීමක් ලෙසින් පළ කිරීමයි.
මෙම ප්‍රවෘත්තියේ කියැවෙන්නේ අඟහරු මත ගඩොල් තොගයක් සොයාගෙන ඇති බව නාසා ආයතනය හෙළි කර ඇති බවත්, එම ගඩොල් වසර බිලියන 3.5 ක් පැරණි බවත්, ඒ නයින් සනාථ වන්නේ අඟහරු මත ජනාවාස තිබීම බවත් වේ. එය තහවුරු කිරීම උදෙසා නාසා ආයතනය සහ නාසා අභ්‍යවකාශ භූ විද්‍යාඥවරියක් මෙහිදී මූලාශ්‍ර ලෙසින් සටහන් කර ඇත!

මෙම ලිපිය පාදක කොටගෙන ඇති ජාත්‍යන්තර ප්‍රවෘත්තියේ සඳහන් වන්නේ "Basic building blocks of life" හෙවත් ජීවයේ මූලික තැනුම් ඒකක ලෙසින් හැඳින්විය හැකි කාබනික අණු අඟහරු මතින් සොයාගෙන ඇති බවට නාසා ආයතනය විසින් කළ ප්‍රකාශයයි. එසේම මෙය ජීවය තිබුණු බව තිරව පැවසෙන සාක්ෂ්‍යයක් නොවන බවද විද්‍යාඥ ජෙනිෆර් අයිගන්බ්‍රෝඩ් විසින් අවධාරණය කරයි. මෙය වරදවා වටහා ගත් පසුව එතැන් සිට ප්‍රවෘත්තිය ලියැවී ඇත්තේ අදාළ මාධ්‍යවේදියාගේ වටහාගැනීම සහ කාල්පනික කාරණාවන්ට අනුව බව පැහැදිලි වේ.

ජගත් දැනුම් සම්පත් සඳහා ප්‍රවේශ වීම ඕනෑම අයෙකුට අසීරු කරුණක් නොවේ. මෙම සාවද්‍ය ප්‍රවෘත්තියද මේ වනවිට සමාජ මාධ්‍ය ජාලයන් ඔස්සේ දැඩි විවේචනයට ලක් වෙමින් තිබීම එයට උදාහරණ වේ.
මෙය සාවද්‍ය ප්‍රවෘත්තියක් ජනගත කිරීමක් ලෙසින් සිදුකරනා මාධ්‍ය ආචාර ධාර්මික උල්ලංඝනය සම්බන්ධයෙන් අමුතුවෙන් කිව යුතු නොවේ. ජාත්‍යන්තර මූලාශ්‍ර පවා උපුටා දක්වමින් කණගාටුදායක මට්ටමකින් ලියැවී ප්‍රකාශයට පත් වන මෙවැනි පුවතක් සම්බන්ධයෙන් නැවත පිරික්සුමක් සිදුකරනා සංස්කාරකවරයෙකු නොසිටීද? විද්‍යාත්මක කාරණා/තාක්ෂණික කාරණා අඩංගු ලිපි සම්පාදනය, ඒ ඒ විෂයන්හි හසළ දැනුමක් ඇති හෝ අඩු තරමින් විදෙස් භාෂාවන්ගෙන් ඒ සම්බන්ධව පළ වී ඇති ලිපි කියවා තේරුම් ගනිමින් මනා පර්යේෂණයක් සිදු කිරීමට දැනුම ඇති අයවලුන් අතින් සිදු විය නොයුත්තේද?

ඒ සම්බන්ධයෙන් බැරෑරුම් ලෙසින් සිය අවධානය යොමු කිරීමට දිවයින පුවත්පතට කාලය පැමිණ ඇති බව අපි අවසානයේදී සටහන් කරමු.